ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ ගණයට අයත් වත්කම් වර්ග 02 ක පෙර වර්ෂයේ අවසන් ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර, රු.21,933,616 ක නොසැසඳීමක් පැවතුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව.	මූල්‍ය ප්‍රකාශන, පෙර වර්ෂයේ අවසන් ශේෂ සමඟ අනුරූපීව පිළියෙල කළ යුතු අතර නොසැසඳීම සසඳා ගිණුම් නිවැරදි කළ යුතුය.
(ii)	2018 වර්ෂයේදී ස්ථාපිත කළ රු.2,405,200 ක වටිනාකමින් යුත් සූර්යය විදුලි බල පද්ධති 02 ක් සමාලෝචිත වර්ෂයේදී ද, ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 පෙබරවාරි මස නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව.	වත්කම්වල නිවැරදි වටිනාකම් ගිණුම්ගත කර දේපළ පිරියත හා උපකරණ ශේෂය නිවැරදි කළ යුතුය.

(ආ) විගණන සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේදී දේපල, පිරියත උපකරණ සඳහා (9152 කේතයට අදාළව) රු.32,536,300 ක් ගැලපීම් කර තිබුණු අතර එම ගැලපීම් සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.	රු.19,061,973 හි වෙනස එම වර්ෂයේ ආරම්භක ශේෂයන් ඇතුළත් කිරීමේදී වර්ෂයේ එකතු කළ වටිනාකම වන බව.	ශේෂයන්ට සිදුකරනු ලබන ගැලපීම් සඳහා ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතු අතර, අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ 1.6.1 (අ) (i) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6.1 (අ) (ii) ඡේදයේ සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණව නිවැරදිව පිළියෙල කළ යුතු වුවත්, වැය විෂයයන් 08 ක එකතුව රු.මිලියන 618.7 ක් වූ මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 225.24 ක් එනම්, සියයට 30 සිට සියයට 82.5 ක දක්වා වූ ප්‍රමාණයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් සඳහා මාරු කිරීම් කර තිබුණි.	අපේක්ෂිත වියදම් ඇති නොවීම්, වැය විෂයයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම, යනාදී හේතු මත ප්‍රතිපාදන මාරු කර ඇති බව	මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන නිවැරදිව පිළියෙල කළ යුතු අතර වෙන් කර ගත් වැය විෂයට අදාළ ප්‍රතිපාදන ක්‍රියාකාරී සැලැස්මේ යෝජිත ක්‍රියාකාරකම් සඳහා යෙදවිය යුතුය.
(ආ)	වැය විෂයන් 09 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 23.75 කින් රු.මිලියන 10.49 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර, එනම් සියයට 31.5 සිට සියයට 62.6 දක්වා ප්‍රමාණයකින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.	වැඩියෙන් අයවැය ප්‍රතිපාදන වෙන්කර තිබීම, අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදුනොවීම, වියදම් පාලනය යනාදී හේතු මත අදාල ඉතිරිවීම් සිදුව ඇති බව.	- එම -.
(ඇ)	තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ වෙන්කරන ලද එකතුව රු.4,761,500 ක් වූ මුළු ප්‍රතිපාදන මුදලම උපයෝජනය කර නොතිබුණි.	යෝජිත ඉඩමේ ඉදිකිරීම් සිදුකිරීම සඳහා විරෝධතා මතුවීම, තෝරාගත් ඉඩම ප්‍රමාණවත් නොවීම හා ඇළ රක්ෂිතයක් වීම, ජනාධිපතිවරණය හේතුවෙන් නව ව්‍යාපාති ආරම්භ නොකිරීම යන හේතූන් මත මෙම ව්‍යාපෘති ක්‍රියත්මක කිරීමට නොහැකි වී ඇති බව.	විධිමත් සැලසුමකින් තොරව ව්‍යාපෘති තෝරාගත් නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමත්, වෙන් කරන ලද ප්‍රතිපාදන පූර්ණ උපයෝජනයට සැලසුම් සැකසීමත් කළ යුතුය.

3.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකරන පරීක්ෂාවන්ට අදාළ වාර්තා මඟින් එම අවශ්‍යතාව ඉටුකර ඇති බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
(i)	මුදල් රෙගුලාසි 137 හා 138	376,527	ගෙවීම් අනුමත කිරීම හා සහතික කිරීමකින් තොරව තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය තුළ වවුචර් 06 ක් සඳහා ගෙවීම් කර තිබුණි.	ඇණවුම් කළ භාණ්ඩ වලින් කොටසක් පමණක් ලැබී ඇති බැවින් චෙක්පත් නිකුත් නොකර ඉතිරි ලිපිද්‍රව්‍ය ලැබීමෙන් පසු වවුචර් වල අඩුපාඩු ද නිවැරදි කර මේ වන විට මෙම චෙක්පත් අදාළ ආයතන වලට නිකුත් කර ගෙවීම් කටයුතු අවසන් කර ඇති බව.	මුදල් රෙගුලාසි වලට පටහැනිව වවුචර් සඳහා ගෙවීම් කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.

(ii)	මුදල් රෙගුලාසි 237 (ආ)	563,400	භාණ්ඩ ලැබී ඇති බවට හා එම භාණ්ඩ තොග ලේඛන වලට ඇතුළත් කර ඇති බවට සහතිකයක් වවුචරයට අමුණා තැබිය යුතු වුවත්, තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගන්නා ලද, වායු සමීකරණ යන්ත්‍ර වෙනුවෙන් 2024 දෙසැම්බර් 20 දින චෙක්පත මගින් ගෙවීම් සිදු කිරීමේදී අදාළ භාණ්ඩ ලැබී ඇති බවට තහවුරු කර ගැනීමෙන් තොරව ගෙවීම් සහතික කර තිබුණි.	විගණන නිරීක්ෂණය පිළිගන්නා බව.	මුදල් රෙගුලාසි වලට පටහැනිව ගෙවම් සිදු කළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය.

3.4 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නොච්චියාගම, ගලෙන්බිඳුණුවැව, තඹුත්තේගම සහ මහ විලච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල බද්දට යටත් වන නිලධාරීන්ගේ සේවා නියුක්ති ආදායමින් ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය කිරීමේදි (APIT Tax) වැඩ බැලීමේ දීමනා, පෞද්ගලික පරිහරණය සඳහා භාවිතයට ගන්නා රජයේ වාහන, විවිධ දීමනා සහ නිල නිවාස දීමනා ආදිය බදු ගණනය කිරීම සඳහා ආදායම් ලෙස සැලකිල්ලට ගෙන නොතිබුණි.	සමහර ගෙවීම්, වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් ලෙස සලකා අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ධ ගණනය කිරීමේදී බැහැර කර ඇති බවත් අනෙකුත් ගෙවීම් බදු ගණනය කිරීම සඳහා ඇතුළත් කර හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව.	ආදායම් බදු පනත ප්‍රකාරව කටයුතු කර හිඟ බදු මුදල් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය.

3.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශ වනිතා සංවර්ධන නිලධාරී ලෙස සේවය කළ නිලධාරිණියක් විසින් 2017 වර්ෂයේ දී සිදුකළ රු.90,000 ක මුල්‍ය වංචාවක් සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියාමාර්ග ගැනීමට හා අදාළ මුදල අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.	අනු/2/4/1/3/7 හා 2024.07.24 දිනැති ලිපිය මගින් එම තීරණය ලේකම්, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇති නමුත් ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා කිසිදු උපදෙසක් මේ දක්වා ලැබී නොමැති බව.	අමාත්‍යාංශය හා සම්බන්ධ වී විධිමත් විනය ක්‍රියාමාර්ග ගෙන මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බල ප්‍රදේශයේ විහාරයක සංඝාවාස ගොඩනැගිල්ල පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී ඉටු නොකරන ලද වැඩ විෂයක් වෙනුවෙන් රු.107,160 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.	ඉදිකිරීම් කටයුතුවලදී සිදුවී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටුවේදී ද සාකච්ඡා කළ අතර මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර විගණනය වෙත තොරතුරු වාර්තා කරන බව.	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර වැඩියෙන් මුදලක් ගෙවා ඇති මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මාර්ගයක් බොරළු දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ගෙවීම් කිරීමේදී වැඩ විෂය දෙකක් සඳහා පිළිවෙලින් රු.353,968 ක් හා රු.115,748 ක් ලෙස එකතුව රු.469,716 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	ඇස්තමේන්තු සැකසීමේදි බොරළුවල ක්ෂේත්‍ර ඝනත්වයේ මධ්‍යස්ථ අගය ලෙස 1.35 ලෙස යොදා ඇස්තමේන්තු සකසා තිබුණ නමුත් ගෙවීම් කිරීමේදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ රසායනාගාර වාර්තා අනුව ක්ෂේත්‍ර ඝනත්වයේ මධ්‍යස්ථ අගය ලෙස 1.83 ලෙස ගණනය කර ගෙවීම් සිදු කිරීම හේතුවෙන් බව වාර්තා කර ඇත.	- එම -.
(ඇ)	මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තෙප්පන්කුලම ධර්ම බෝධි විහාර මාවත බොරළු දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තුවේ වැඩ විෂය දෙකක් සඳහා පිළිවෙලින් රු.686,648 ක් හා රු.224,536 ක් වශයෙන් එකතුව රු.911,184 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	ඇස්තමේන්තු සැකසීමේදි බොරළුවල ක්ෂේත්‍ර ඝනත්වයේ මධ්‍යස්ථ අගය ලෙස 1.35 ලෙස යොදා ඇස්තමේන්තු සකසා තිබුණ නමුත් ගෙවීම් කිරීමේදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ රසායනාගාර වාර්තා අනුව ක්ෂේත්‍ර ඝනත්වයේ මධ්‍යස්ථ අගය ලෙස 1.83 ලෙස ගණනය කර ගෙවීම් සිදු කිරීම හේතුවෙන් බව වාර්තා කර ඇත.	- එම -.

(ඇ)	මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඇළ කන්ද පාර, වාරිමාර්ග ඇල පාර බොක්කු 02 ක් හා බොරළු දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තුවේ වැඩ විෂය දෙකක් සඳහා පිළිවෙලින් රු.180,773 ක් හා රු.59,113 ක් වශයෙන් එකතුව රු.239,886 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	ඇස්තමේන්තු සැකසීමේදි බොරළුවල ක්ෂේත්‍ර ඝනත්වයේ මධ්‍යස්ථ අගය ලෙස 1.35 ලෙස යොදා ඇස්තමේන්තු සකසා තිබුණ නමුත් ගෙවීම් කිරීමේදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ රසායනාගාර වාර්තා අනුව ක්ෂේත්‍ර ඝනත්වයේ මධ්‍යස්ථ අගය ලෙස 1.83 ලෙස ගණනය කර ගෙවීම් සිදු කිරීම හේතුවෙන් බව වාර්තා කර ඇත.	- එම -.
(ඉ)	මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තෙප්පන්කුලම නිවාස 20 මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තුවේ වැඩ විෂය දෙකක් සඳහා පිළිවෙලින් රු.557,022 ක් හා රු.182,148 ක් වශයෙන් එකතුව රු.739,170 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	ඇස්තමේන්තු සැකසීමේදි බොරළුවල ක්ෂේත්‍ර ඝනත්වයේ මධ්‍යස්ථ අගය ලෙස 1.35 ලෙස යොදා ඇස්තමේන්තු සකසා තිබුණ නමුත් ගෙවීම් කිරීමේදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ රසායනාගාර වාර්තා අනුව ක්ෂේත්‍ර ඝනත්වයේ මධ්‍යස්ථ අගය ලෙස 1.83 ලෙස ගණනය කර ගෙවීම් සිදු කිරීම හේතුවෙන් බව වාර්තා කර ඇත.	- එම -.
(ඊ)	හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නිකවැව මුස්ලිම් විද්‍යාලේ මහල් දෙකකින් යුත් පන්ති කාමර ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සිදුකිරීම සඳහා ගෙවීම් කිරීමේදී වැඩ විෂයයන් 03 ක් සඳහා එකතුව රු.111,037 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය වෙත අනුඥාත කරන ලද මෙම ව්‍යාපෘතිය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ගිවිසුම් ගතව අධීක්ෂණ කටයුතු මෙන්ම ගෙවීම් කටයුතු ප්‍රාදේශීය ඉංජිනේරුගේ අනුමැතිය සහිතව සිදු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ඉල්ලා 2025.05.21 දින කලාප අධ්‍යක්ෂ වෙත ලිපියක් යොමු කර ඇති බව.	- එම -
(උ)	හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වීරසෝලේ මුස්ලිම් විද්‍යාලේ ගොඩනැගිල්ලක ඉදිකිරීමේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා ගෙවීම් කිරීමේදී අතිරේක වැඩ විෂයක් සඳහා රු.446,994 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය වෙත අනුඥාත කරන ලද ව්‍යාපෘතිය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ගිවිසුම් ගතව අධීක්ෂණ කටයුතු මෙන්ම ගෙවීම් කටයුතු ප්‍රාදේශීය ඉංජිනේරුගේ අනුමැතිය සහිතව සිදු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ඉල්ලා 2025.05.21 දින කලාප අධ්‍යක්ෂ වෙත ලිපියක් යොමු කර ඇති බව.	- එම -

4.2 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන තීරණ අංක 2024/25 ට අනුව ඡායා පිටපත් යන්ත්‍රයක් ගැනීමේදී සාධාරණ හේතු දැක්වීමකින් තොරව ලැබී තිබුණු අවම මිල ප්‍රතික්ෂේප කර රු.80,000 ක් වැඩිපුර ගෙවා මිලදී ගැනීම සිදුකර තිබුණි.	තාක්ෂණික පිරිවිතරයන් නිසි පරිදි සපුරා නොතිබූ බැවින් අවම මිල ගණන් ඉදිරිපත් කළ ලංසුව ප්‍රතික්ෂේප කරන ලද බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය
(ආ)	2024 වර්ෂයේ ජනවාරි මස සිට 2024 සැප්තැම්බර් මස 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.6,522,501 ක් වූ මිලදී ගැනීම් සිදුකර තිබුණු නමුත් 2024 වර්ෂය සඳහා වර්ෂය ආරම්භයේ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	පිළිගනිමි. 2025 වර්ෂය සඳහා මේ වන විට ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇති බව.	වර්ෂය ආරම්භයේම විධිමත් පරිදි ප්‍රසම්පාදන සැලසුමක් සකස් කළ යුතුය.

4.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පලාගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රාජ්‍ය ආයතන සතුව පැවති ගොඩනැගිලි සහිත ඉඩම් හෙක්ටයාර 4.89 ක් හා එම බල ප්‍රදේශයේ වසම් 07කට අයත් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට ශාක්‍යතාවයක් පැවති ඉඩම් හෙක්ටයාර 289.49 ක් ඌන උපයෝජිතව පැවති අතර, එම ඉඩම් සහ ගොඩනැගිලි හඳුනාගෙන කාර්යක්ෂම හා ඵලදායීව යෙදවීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.	මෙම ඉඩම් රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදා ගත හැකි අතර මේ දක්වා එම ඉඩම් සඳහා ඉල්ලීම් ලැබී නොමැත. ඉල්ලීම් ලැබුණු පසු අවශ්‍යතාවය සලකා ඒ අනුව කටයුතු කිරීමට හැකියාව ඇති බව.	සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට ශාක්‍යතාවයක් පවතින ඉඩම් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය යෝජනා සකසා ඉදිරිපත් කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් සතු වත්කම් අයිතම් 185 ක් මාස 03 ත් වසර 10 ත් අතර කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.	අළුත්වැඩියා කර ඵලදායි ලෙස උපයෝජනය කිරීමට සැලැස්මක් සකස් කිරීමට නියමිත බව.	අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.

4.4 කළමනාකරණ දූර්වලතා

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 11 කට අයත් ග්‍රාම නිලධාරී වසම් 119 ක අවසන් වරට ඉඩම් කච්චේරි පවත්වා සමාලෝචිත වර්ෂයේ අවසන් වන විට වසර 02 කට අධික කාලයක් ගත වී තිබුණද, නියමානුකූල නොවු ඉඩම් වෙනුවෙන් බලපත්‍ර ලබා ගැනීමට උනන්දුවන පිරිස් වලට ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඉඩම් කච්චේරි පැවැත්විමට කටයුතු කර නොතිබුණු අතර, මේ හේතුවෙන් මෙම කාලසීමාව තුළ එම වසම්වලින් ඉදිරිපත්ව තිබුණු ඉඩම් කච්චේරි පැවැත්වීමට අදාළ මූලික ආකෘතිපත්‍ර 5,737 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.	පළාත් පාලන මැතිවරණය හා ජනාධිපතිවරණය හේතුවෙන් ඉඩම් කච්චේරි පැවැත්විමට නොහැකි වී ඇති බව.	විධිමත් නීති රාමුව තුළ අප්‍රමාදව ඉඩම් කච්චේරි පැවැත්වීමට කටයුතු කළ යුතුය.
(ආ)	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොවි පන්තියේ පුද්ගලයන්ට බලපත්‍ර සකස් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 09 ක ග්‍රාම නිලධාරී වසම් 115 කට අදාළව පළාත් ඉඩම් කොමසාරිස් විසින් අවසන් තේරීම් ලැයිස්තුව අනුමත කර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත එවා තිබුණ ඉ.කො. 144(ඒ) ආකෘති පත්‍ර 920 ක ප්‍රමාණයක් සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට වසරකට වඩා වැඩි කාලයක් ගත වි තිබුණද, අදාළ බලපත්‍ර සකස් කර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.	විවිධ හේතු මත බලපත්‍ර ලබාදිමට නොහැකි වී ඇති බව.	පවතින ගැටළු කඩිනමින් නිරවුල් කර ගැනීමටත්, ගැටළු නොමැති බලපත්‍ර කඩිනමින් ලබාදීමටත් කටයුතු කළ යුතු අතර, කාර්යක්ෂමව බලපත්‍ර ලබා දීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත විධිමත් පරිදි කටයුතු කළ යුතුය.
(ඇ)	ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 12 ක ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගැනුම් මිලට බලපත්‍ර සකස් කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් විසින් අවසන් තේරීම් ලැයිස්තුව අනුමත කර, එවා තිබු ඉ.කො 144(ඒ) ආකෘති පත්‍ර 1968 ක ප්‍රමාණයක් සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට වසරකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද, ගැනුම් මිලට බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවා ගෙන තිබුණි. එසේම බලපත්‍ර නිකුත් නොකිරීම නිසා දළ තක්සේරුව මත අයවිය යුතු ආදායමක් අයකර ගැනීමට ද නොහැකි වී තිබුණි.	විවිධ හේතු මත බලපත්‍ර ලබාදිමට නොහැකි වී ඇති බව.	- එම -

(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක රු.311,642,207 ක හිඟ බදු අයවිය යුතුව පැවතුණි.	හිඟ බදු වලින් කොටසක් අයකර ගෙන ඇති බව.	කාලීනව බදු අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, අයවිය යුතු හිඟ බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතුය.
(ඉ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට විධිමත් අනුමැතිය ලැබී මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණු ලිපිගොනු 297 ක් හා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණු ලිපිගොනු 97 කට අදාළව දළ තක්සේරුව මත බදු මුදල අය කිරීමට කටයුතු කර නොතිබුණි.	දළ තක්සේරු මත බදු මුදල් අයකර ගැනිමට කටයුතු කරමින් පවතින බව.	- එම -
(ඊ)	ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 05 කට අදාළව පළාත් ඉඩම් කොමසාරිස් විසින් දීර්ඝකාලීන බදු පදනම මත බලපත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණු ලිපිගොනු 255 ක ප්‍රමාණයක් සඳහා ඉඩම් නිලධාරීන් වෙත දළ අනු රේඛන සකස් කිරීම සඳහා ලබාදී වසර 01 ත් වසර 06 ත් අතර කාලපරිච්ඡේදයක් ගත වී තිබුණද දළ අනුරේඛන සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. ඒ හේතුවෙන් දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය ප්‍රමාද වී තිබුණි.	දළ අනු රේඛන සකස් කිරිමට කටයුතු කරමින් පවතින බව.	දළ අනු රේඛන සකස් කර දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු නොකළ නිලධාරීන් සම්බන්ධව විධිමත් කටයුතු කිරීමටත්, කඩිනමින් කටයුතු කර හිඟ බදු අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(උ)	පළාත් ඉඩම් කොමසාරිස් විසින් දීර්ඝකාලීන බදු පදනම මත බලපත්‍ර නිකුත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 04 කට අදාළව අයදුම්පත් 509 ක ප්‍රමාණයකට අනුමැතිය ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට අදාළ අනුමැතිය ලැබී වසර 01 ත් වසර 17 ත් අතර කාලපරිච්ඡේදයක් ගත වී තිබුණද, බදුකරුවන් විසින් මූලිකව ඉදිරිපත් කළයුතු අයදුම්පත භාර නොදීම මත අයදුම්පත් 494 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. අදාළ පුද්ගලයන් විසින් දීර්ඝකාලීන බලපත්‍ර නොමැතිව ඉඩම් භුක්ති විඳිමින් සිටින්නේද යන්න සොයා බැලීම කෙරෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවධානය යොමු වී නොතිබුණු අතර මේ හේතුවෙන් බදු ගණනය කිරීම් ක්‍රියාවලිය ප්‍රමාදවීම තුලින් රජයට හිමිවිය යුතු බදු ආදායමක් අහිමි වී තිබුණි.	මූලිකව ඉදිරිපත් කළයුතු අයදුම්පත භාර නොදුන් බදුකරුවන් වෙත සිහි කැඳවීම් ලිපි යොමු කිරීම හා ග්‍රාම නිලධාරී මගින් දැනුවත් කිරීම සිදු කොට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව.	මූලිකව ඉදිරිපත් කළයුතු අයදුම්පත් භාර නොදුන් බදුකරුවන්ගෙන් අදාළ ලියකියවිලි කඩිනමින් ලබා ගෙන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධව කාලීනව පියවර නොගත් නිලධාරීන් සම්බන්ධ පියවර ගත යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 35 ක් ද, තෘතීයික මට්ටමේ තනතුරු වල පුරප්පාඩු 13 ක් ද, ද්විතීක මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 77 ක් ද සහ ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 18 ක් ද, පැවතුණි.	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම කාර්යාලයේ හා ප්රාදේශීය ලේකම් කාර්යාල 22 හි අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු නිවැරදි බව.	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අත්‍යවශ්‍යම පුරප්පාඩු පමණක් පිරවීමට කටයුතු කළ යුතුය.